පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සබරගමුව - සති පාසල

අප්‍රේල් 3 වන සතිය

විෂය - විද්‍යාව

9 ශ්‍රේණිය


කාලය - පැය 2

සැකසුම - එස්.ඒ. අමාලි උදයංගනී
ර/නිවි/ නහල්වතුර විද්‍යාලය

**ඒකක අවසාන අභ්‍යාස.**

* නැවත 1,2,3,4 හා 5 පාඩම් කියවා පිලිතුරු සපයන්න.

1. ප්‍රොටෝසෝවා කාණ්ඩයට අයත් ජීවියෙක් වන්නෙ,
   a. යීස්ට්
   b. පැරමීසියම්
   c. මියුකර්
   d. ඩයමට
2. විෂහරණය කරල ලද ධූලක එන්නතක් ලෙස භාවිතා කරන්නේ මේ අතුරින් කුමන රෝගයක් සඳහාද ?
   a. සරම්ප
   b. කොළරාව
   c. පිටගැස්ම
   d. හෙපටයිටිස් B
3.



මෙම කිරණ රූප සටහනට අදාල අක්ෂි දෝෂය කුමක්ද?

   a. ග්ලූකෝමාව
   b. අවිදුර දෘෂ්ඨිකත්වය
   c. විදුර දෘෂ්ඨිකත්වය
   d. ඇසේ සුද

4. ද්විනේත්‍රික දෘෂ්ටි පරාසය වැඩි මේ අතරින් කාගේද ?
    a. මුවා
    b. කොටියා
    c. බල්ලා
    d. ගෝරිල්ලා
5. මේ අතරින් සංයෝග පමණක් අන්තර්ගත වරණය කුමක්ද ?
    a. C, O, H
    b. Hg,NaCl, S
    c. $H_2O$, $CO_2$, $NH_3$
    d. Cu, $H_2O$, NaCl
6. මුහුදු ජලයෙන් ලුණු ලබාගැනීමට භාවිතා කරන ක්‍රමය වන්නෙ,
    a. සරල ආසවනය
    b. වාෂ්පීභවනය
    c. හුමාල ආසවනය
    d. භාගික ආසවනය
7. දෛශික රාශියක් යනු,
    a. විශාලත්වයක් පමණක් ඇති රාශියකි,
    b. දිශාවක් පමණක් ඇති රාශියකි.
    c. විශාලත්වයක් මෙන්ම දිශාවක් ඇති රාශියකි.
    d. ස්කන්ධයක් පමණක් ඇති රාශියකි.
8. බලයේ විශාලත්වය මැනීමට විද්‍යාගාරයේ භාවිතා වන උපකරණය වන්නෙ,
    a. තෙදඬු තුලාව
    b. සිව්දඬු තුලාව
    c. නිව්ටන් තුලාව
    d. ඉලෙක්ට්‍රොනික තුලාව
9. පීඩනය කෙරෙහි බලපාන සාධක වන්නෙ,
    a. අභිලම්බ බලය
    b. ස්කන්ධය
    c. වර්ගඵලය
    d. අභිලම්බ බලය හා වර්ගඵලය
10. වර්ගඵලය $4m^{-2}$ වූ පෘෂ්ඨයක් මත යෙදන අභිලම්බ බලය නිසා ඇතිවූ පීඩනය 5 $Nm^{-2}$ වේ. එම පෘෂ්ඨය මත යෙදෙන බලය වන්නෙ ?
    a. 40 N
    b. 20 N
    c. 100 N
    d. 45 N